# සංස්කෘතික උරුමය ආරක්ෂා කරගැනීම සඳහා භික්ෂු සමාජයේ කාර්යභාරය

## (සාහිත්‍ය හා අභිලේඛන සාධක ඇසුරින් කෙරෙන අධ්‍යයනයක්)

එච්. එම්. එස්. කේ. හේරත්[1]

### හැඳින්වීම

ලංකා ඉතිහාසය සම්බන්ධයෙන් ලියැවී තිබෙන සාහිත්‍ය මූලාශ්‍රයවල ක්‍රිස්තු පූර්ව හය වැනි සියවසේ සිට සමාජයේ පැවති ආර්ථික, දේශපාලනික, ආර්ථික හා සාමාජීය කරුණු බොහෝමයක් ඇතුළත් කර තිබේ. එසේම සෙල්ලිපිවල ද සංස්කෘතික උරුමය ආරක්ෂා කර ගැනීම උදෙසා භික්ෂූන් වහන්සේලාට උපදේශය ලබා දී තිබෙන බව ඒවා අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි විය. සාහිත්‍ය හා අභිලේඛන මූලාශ්‍රයවල සංස්කෘතික උරුමය ආරක්ෂා කර ගැනීම උදෙසා අවධියෙන් අවධිය ගෙන තිබෙන ක්‍රමවේද පිළිබඳ තොරතුරු සඳහන් කර තිබේ. බෞද්ධ ග්‍රන්ථවලද ඒ සම්බන්ධ තොරතුරු සඳහන් වේ. බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම්වල භික්ෂූන් වහන්සේලාට තම වාසස්ථාන සකස්කර ගැනීමටත් එහිදී ඇතිවන ගැටලු විසදා ගැනීම සඳහාත් අවශ්‍ය උපදෙස් බුදු රජාණන් වහන්සේ විසින් ලබා දී ඇත. සංඝා වහන්සේලාට පමණක් තනිව උරුමය ආරක්ෂාකර ගැනීමට නොහැකි නිසාවෙන් පාලකයාගේ සිට සාමාන්‍ය ජනයා දක්වා ම විහාරාරාම උදෙසා විවිධ ප්‍රදානයන් ලබා දී තිබේ. ඒ පිළිබඳ තොරතුරු සාහිත්‍ය හා අභිලේඛන මූලාශ්‍රයවල ඇතුළත් කර තිබේ.

### ක්‍රමවේදය

වර්තමානයේ සංස්කෘතික උරුමය විනාශ කිරීම උදෙසා විවරදාරීන් පෙරමුණ ගෙන තිබෙන බව ජනමාධ්‍ය මඟින් අසන්නට දකින්නට ලැබෙන තොරතුරුවලින් හා පුරාවස්තු විනාශය කිරීම් සම්බන්ධයෙන් වාර්තා වී තිබෙන සිදුවීම් අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වුණි. අතීතයේ දී මෙම තත්ත්වය පාලනය කර ගැනීම උදෙසා විවිධ උපදෙස් ලබා දී තිබේ. සංස්කෘතික උරුමය ආරක්ෂා කර ගැනීම සඳහා ආගමික අංශයේ දායකත්වය අධ්‍යයනය කිරීම උදෙසා මූලාශ්‍ය අධ්‍යයනයක් සිදුකරන ලදි.

### ප්‍රතිඵල හා සාකච්ඡා

යථෝක්ත පර්යේෂණයට අනුව භික්ෂූන් වහන්සේලාට තම වාසස්ථාන පරිහරණය කිරීමේදී උපදෙස් ලබාදුන් බව විනය පිටකයේ චුල්ලවග්ගපාළියෙහි

[1] උපාධි අපේක්ෂක, පුරාවිද්‍යාව හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ, hmsumuduherath@gmail.com

සේනාසන සේනාසනඛන්ධකයේ දැක්වෙන කරුණුවලින් පැහැදිලි වේ. එහි විහාරාරාමයේ කැඩී බිඳී යාම්, ක්ෂය වීම් ආදි විවිධ ස්වාභාවික උපද්‍රව අවස්ථාවන්වල දී අලුත්වැඩියා කළ යුතු ආකාරය සඳහන් කර තිබේ. චුල්ලවග්ගපළියේ,

1. සුදු පැහැ කළු පැහැ හා ගුරු පැහැ පිළියම් කිරීම
2. රළු බිත්තියේ සුදු පැහැය නො රැඳෙන විට දහයියා කුඩු අත්ලෙන් තුනී කොට සුදු පැහැය සකස් කිරීම
3. ගුරු පැහැය නො රැඳෙන විට කුඩු මුසු මැටි අත්ලෙන් මැද ගුරු පැහැය ගැනීම
4. බිත්තියේ තැනින් තැන බින්දු වශයෙන් උස් ව නැඟී සිටියේ නම් රෙදි කඩකින් පිස දැමීම
5. බිම කළු පැහැය ගැනීම සඳහා ගැඩවිල් පස්, තෙල්ලි හා මැලියම් අත්ලෙන් මැද ගැම
6. විහාර බිත්ති තෙමෙන විට එහි ආරක්ෂාව සඳහා වසුගොම, අළු මැටි එකට මිශ්‍රකොට පැලැල්ලක් එයට සම්බන්ධ කරගැනීම

යනුවෙන් සඳහන් වේ (චුල්ලවග්ගපාළි, II 1983, 143-145). එසේම බුදුරජාණන් වහන්සේ විසින් අවශ්‍ය අවස්ථාවේදී අලුත්වැඩියා කටයුතු කිරීමට උපදෙස් ලබා දී තිබේ.

> "අනුජානාමි භික්ඛවෙ නවකම්මං දතුං නවකම්මිකො භික්ඛවෙ භික්ඛු උත්සුක්කං ආපජ්ජිස්සති කින්ති නු ඛො විහාරො ඛිප්පං පරියොසානං ගච්ඡෙය්‍යා ති ඛණ්ඩඵුල්ලං පටිසඞ්ඛරිස්සති" (චුල්ලවග්ගපාළි, II, 1983, 170)

විහාරාරාම අලුත්වැඩියා කිරීමේදී එය වැඩිහිටි මහණෙකු ලවා දැන්විය යුතු බව දක්වා තිබේ. සංඝයා වහන්සේලාට සුදුසු කල් ඇති කර්මයෙක් වැටහෙන්නේ නම් සංඝ තෙමේ මේ නම් ගැහැවියාගේ විහාරය මේ නම් මහණහට නවකර්මය පිණිස දෙන්නේය යනුවෙන් සඳහන් කර නවකර්මය කිරීම සඳහා අවසර දී ඇත. එහි නවකර්ම කළ යුතු ආකාරය ද සඳහන් වේ.

- නොකරන ලද්ද වූ අඩාල කළ වැඩ ඇත්තා වූ හෝ විහාර සඳහා නවකර්ම
- කුඩා විහාරයෙහි හෝ (කළයුතු ව ඇති) වැඩ බලා සාවුරුද්දකට හෝ පස් හවුරුද්දකට හෝ සුදුසු වූ නවකර්ම
- ගුරුළු පියාපත් බඳු සෙවෙණි ඇති වෙහෙරක වැඩ බලා වෂී සතකට හෝ අටකට සුදුසු නවකර්ම
- මහත් වෙහෙරෙක හෝ ප්‍රාසාදයෙක හෝ වැඩ බලා නවකම්

යනුවෙන් නවකම් කරන්නට උපදෙස් ලබා දී තිබේ (චුල්ලවග්ගපාළි,II, 1983, 211).

සාහිත්‍යමය ග්‍රන්ථවල හා අභිලේඛන මූලාශ්‍රයවල සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු අනාවරණය වේ. පටිසංකරණය- ප්‍රතිසංස්කරණය, ඛණ්ඩඵුල්පටිසංකරණ- කැඩී බිඳී ගිය තැන් සැකසීම, පුනකරයි- නැවත කරවීම, නවකම්- දිරූ තැන් අලුත්වැඩියාව, පාතනික- දිරූ තැන් ප්‍රකෘතිමත් කිරීම, පිනපටිගතක- දිරූ තැන් සැකසීම, පිනඅපතු- දිරුම් ඉවත් කිරීම, පිනංගෙඹය - දිරූ තැන් පිරවීම, පිනපටිසතර- දිරූ තැන් පිළිසකර කිරීම යනාදි ලෙසින් දක්වා තිබේ. සංඝයා වහන්සේලා විසින් අවශ්‍ය අවස්ථාවේදී ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කළ යුතු බවත් විහාරාරාම ආදි පාලනය සම්බන්ධ කරුණු ද මිහින්තලා සෙල්ලිපියේ සඳහන් වේ.

අතීත සමාජයේ භික්ෂූන් වහන්සේලාට වැදගත් ස්ථානයක් හිමි විය. උන්වහන්සේලා සෑම විටම විහාරස්ථානය හා සංස්කෘතිය ආරක්ෂාකර ගැනීම උදෙසා කැපවී තිබෙන බව ඓතිහාසික සාධකවලින් පැහැදිලි වුණි. ඒනිසා පාලකයාගේ පටන් සාමාන්‍ය ජනයා දක්වා පිරිස් විහාරස්ථානය හා සම්බන්ධ වී තිබෙන අතර විහාරස්ථානයේ නඩත්තු කටයුතු හා ආරක්ෂාව සඳහා විවිධ ප්‍රදානයන් කර තිබේ. ධර්මකිර්ති මාහිමියන් ගේ ප්‍රධානත්වයෙන් කරවන ලද ගඩලාදෙණිය විහාරය සහ විහාර කර්මාන්ත සඳහා මෙන්ම එහි නඩත්තුව සඳහා පිදූ ගම්බිම් ආදිය පිළිබඳ තොරතුරු පර්වත ලිපියෙහි සඳහන් වේ (අමරවංශ හිමි, 2014, 425).

එහි-- [කර්මා] න්තයට පණම් තුන්දසක් වි [වරන්] බිපු --- මුණක් හා ගම් කඩවර එකෙක් සුව [පතිරා] ජයන් උඩුරටලින් පිදූ ගම් කඩවරක් හා ----

මෙහි අලුත්වැඩියා කටයුතු කරන පුද්ගලයින් සඳහා පණම් තුට්ටු හතරක වටිනාකමින් යුත් තඹ කාසියක් ලබාදුන් බවත් ගම් කඩවර ත්‍යාග වශයෙන් ලැබුණු බිම් කොටසක් පිළිබඳව ද තොරතුරු සඳහන්කර තිබේ. මේ මඟින් විහාරාරාම ආරක්ෂාකර ගැනීම උදසො භික්ෂූන් වහන්සේලා කැපවී සිටිබව පැහැදිලි වේ.

ජරාජිර්ණ වූ ගොඩනැගිලි හා ස්මාරක අලුත්වැඩියා කර යහපත් තත්ත්වයෙන් පවත්වා ගැනීම උදෙසා එම ස්ථානවල වාසය කරන භික්ෂූන් වහන්සේලා විසින් ම අවශ්‍ය කටයුතු සංවිධානය කළ යුතු විය. එය ජේතවනාරාම (අභයගිරි) සංස්කෘත ලිපියේ දැක්වේ.

" කං චිගුණා න චිවරිකා, විහාරේ නවකර්ම්ම කෘතොරපි තථා
යන්ත්‍ර යෙ නියුතාස්තත්‍රා විනාශස්තෛරෙව දෙයඃ" (අමරවංශ හිමි, 2014, 154)

විහාරයෙහි නවකම් කරන දෙතැනට ද එසේ මය. යම් තැනෙක යම් කෙනෙක් (පිළිසකර කිරීම්) ආදියෙහි යෙදී සිටිත් ද ඒ අය විසින් ඒ ඒ තැන් නොනසා රැක්ක යුතු බව දක්වා තිබේ. ඉන් පැහැදිලි වන්නේ, විහාරස්ථානයේහි වැඩවාසය කරන භික්ෂූන් වහන්සේලා විසින් එම ස්ථානය නියමිත කාලය තුළදී අලුත්වැඩියා කර ඒවා ආරක්ෂා කරගත යුතු බවයි. විහාර නවකර්මයෙහි නියුක්ත

ග්‍රාමයෙහි දක්ෂ වූ ගල්වඩුවන් සහ ලී වඩුවන් ද සිටිය යුතු ය. ඒ සියල්ලෝම (තම තමන්ගේ) ---- කර්මයෙහි දක්ෂ වූවන් විය යුතුයි යනුවෙන් ජේතවනාරාම (අභයගිරි) සංස්කෘත ලිපියේ දක්වා තිබේ. ඉන් පැහැදිලි වන්නේ විහාර අලුත්වැඩියා සිදු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික ශිල්පීන් විහාරස්ථානයට ප්‍රදානය කළ ගම්වලින් ම සපයා ගෙන ඇති බවයි. ඔවුන්ට පැවරූ කාර්යය ඉටු කිරීම සඳහා ඔවුන් කැපවී සිටිය යුතු ය.

විහාරස්ථානවල ආරක්ෂාව සඳහා ලැබෙන ආදායම ඒ සඳහා ලබා දී ආරක්ෂා කළ යුතු බව මිහින්තලා පුවරු ලිපියෙහි සඳහන් වේ. එම පුද්ගලයින්ට ලබා දිය යුතු මුදල ද එහි තීරණය කර තිබේ. ''නවගුණ මහ සෑයෙහි ද නැටෙවිය මහ සෑයෙහි ද අම්බත්ථල චෛත්‍යයෙහි චෛත්‍යාරක්ෂකයන් තුන්දෙනෙකුට එක් කෙනාට (කිරියෙන්) බාගය බැගින් ද මේ විහාරයෙහි පර්වතය මුදුනේ හා පර්වතය පහළ ද ඇතුළු වෙහෙරට අයත් දාගැබ් ආදි අතු ගා පිරිසිදු කොට රක්නාවුන්ට දම්යෙන් එක් කොටසක් බැගින් ද දිය යුතු'' බව දක්වා තිබේ. ඉන් විහාරස්ථානය නඩත්තු කරමින් ආරක්ෂා කරන පිරිසක් හා ආරක්ෂක නිලධාරීන් සිටි බවත් ඔවුනට වැටුප් ද ලබා දී තිබෙන බව පැහැදිලි වේ. විහාරාරාම සතු ගම් බිම් උකස් කිරීම හෝ පැවරීම කළ නොහැකි බව ද එහි සඳහන් කර තිබේ. එසේම විහාරාරාම සතු දේපල සොරා ගැනීම, විනාශ කිරීම හා අලාභහානි කරන්නවුන් බල්ලන් කපුටන් වී උපදින බව ශාප පාඨවල සඳහන් වේ. ශාප පාඨ බිහිවන්නේ ද විහාරාරාම සතු දේපල ආරක්ෂාකර ගැනීම උදෙසාමය. සංස්කෘතික උරුමය ආරක්ෂාකර ගැනීමේහිලා භික්ෂූන්වහන්සේලා විසින් විවිධ මැදිහත්වීම් සිදුකර තිබෙන බව සාහිත්‍ය මූලාශ්‍රයයන් හා අභිලේඛන මූලාශ්‍ර අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වේ.

ප්‍රමුඛ පද ෑ සංස්කෘතික උරුමය, විහාරාරාම, සාහිත්‍ය මූලාශ්‍රය, අභිලේඛන මූලාශ්‍රය

ආශ්‍රිත ග්‍රන්ථ

*මහාවංශය.* (1967). (සංස්.) ශ්‍රී සුමංගල හිමි හික්කඩුවේ හා දේවරක්ෂිත බටුවන්තුඩාවේ. කොළඹ: රත්නාකාර යන්ත්‍රාලය.

අභයවර්ධන, එච්. ඒ. පී. (1978, 1996). *කඩඉම්පොත් විමර්ශනය,* ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේතු.

අමරවංශ හිමි, කොත්මලේ. (1961). *ලක්දිව සෙල්ලිපි.* කොළඹ: සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

කුලතුංග ටී.ජී. (2005). *අභිලේඛන ශාපපාඨ* (සංශෝධිත මුද්‍රණය). මහරගම: තරංජි ප්‍රින්ට්ස්.

ගුණවර්ධන, ප්‍රිශාන්ත. (2005). *පුරාවිද්‍යා උරුමය ආකෘති. සංකල්ප සහ කළමනාකරණය.* ජාඇල: සමන්ති පොත් ප්‍රකාශකයෝ.